# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2235/69 - 2021 ජූලි මස 09 වැනි සිකුරාදා - 2021.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනතේ 51 වන වගන්තිය ප්‍රකාරව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන දැනුම් දීම

රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) 51 වන වගන්තිය මගින් මා වෙත පවරා ඇති බලතල අනුව, රේගු අධ්‍යක්ෂ ජනරාල්, ගංවාරිගේ විජිත රවිප්‍රිය වන මම මෙසේ දැනුම් දෙමි. ආනයනකරු හෝ ආනයනකරුගේ නියෝජිතයා විසින් රේගු ආඥාපනතේ 51 වන වගන්තියේ විධිවිධානයට අනුකූලව සිදුකළ යුතු ප්‍රකාශනය (මෙතැන් සිට "අගය ප්‍රකාශනය" ලෙස හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන), උපලේඛනයේ දක්වා ඇති පරිදි, මි.මී. 210 x මි.මී. 297 (A4) විශාලත්වයෙන් හා ඝන මීටරයට ග්‍රෑම් 80ක් වූ ඝනත්වයෙන් යුත් සුදු පැහැති කඩදාසියෙන් සැකසූ ආකෘති පත්‍රයක ඉදිරිපත් කළ යුතුය.

අගය ප්‍රකාශනය යනු, රේගු ආඥාපනතේ 47 වන වගන්තියේ අවශ්‍යතාවය පරිදි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන රේගු සටහන්කරයෙහි දක්වා ඇති අයිතමයන් සම්බන්ධව ඒ ඒ සෑම අයිතමයකම අගය පිළිබඳ තහවුරු කිරීමක් විය යුතු අතර එම අගය ප්‍රකාශනයෙහි දක්වා ඇති විස්තර ඊට අදාළ ලේඛනවලින් තහවුරු කර තිබිය යුතුය.

අගය ප්‍රකාශනය, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සපයා ඇති ස්වයංක්‍රීය රේගු නිෂ්කාශන පද්ධතිය හරහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විද්‍යුත් මාර්ගයෙන් ලබා දිය හැකිය. කෙසේ වුව ද, භෞතික ලියකියවිලි රහිත වූ නිෂ්කාශන ක්‍රමය හඳුන්වා දෙන තෙක් ස්වයංක්‍රීය රේගු නිෂ්කාශන පද්ධතිය හරහා මුද්‍රණය කර ගනු ලබන තිසි පරිදි අත්සන් කරන ලද මුද්‍රිත අගය ප්‍රකාශනය, රේගු ප්‍රකාශනය සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එවිය යුතුය.

මෙම නිවේදනය 2021 වර්ෂය ජූලි මස 12 වැනි දින සිට බලපැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු ආඥාපනතේ 51 වන වගන්තිය ප්‍රකාරව 2003 ජනවාරි මස 07 දිනැති අංක 1260/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද නිවේදනය මෙයින් අහෝසි කරනු ලැබේ.

විශ්‍රාමික මේජර් ජනරාල් ජී. වී. රවිප්‍රිය,
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

2021 ජූලි මස 08 වැනි දින,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ 11




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ශ්‍රී ලංකා රේගුව**

අගය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය

1. රේගු ආඥාපනතේ "ඉ" උපලේඛනයෙහි 8 (1) ව්‍යවස්ථාවට අනුව ඉන්වොයිසියේ ඇතුළත්කර නොමැති පහත දක්වනු ලබන පිරිවැය සහ සේවාවන් සඳහන් කරන්න.

   1.1 තැරැව් ගාස්තු සහ කොමිස් : .......................................

   1.2 බහාලුම් පිරිවැය : .......................................

   1.3 ඇසුරුම් පිරිවැය : .......................................

   1.4 ගැනුම්කරු විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවා පිරිවැය : .......................................

   1.5 පුරස්කාරය (කර්තෘභාගය) සහ බලපත්‍ර ගාස්තු : .......................................

   1.6 විකුණුම්කරු වෙත උපචිතවන ආදායමේ වටිනාකම : .......................................

   1.7 ප්‍රවාහන පිරිවැය : .......................................

   1.8 ශ්‍රී ලංකා වරාය කරා ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වූ වෙනත් ගාස්තු : ...............................

   1.9 රක්ෂණ පිරිවැය : .......................................

   1.10 ඉහතින් ප්‍රකාශ නොකරන ලද වෙනත් ගාස්තු : .......................................

   එකතුව .......................................

2. රේගු ආඥාපනතේ "ඉ" උපලේඛනයෙහි 9 වන ව්‍යවස්ථාවට අනුව ඔබ විකුණුම්කරු හා සම්බන්ධ තැනැත්තෙක් වන්නේ ද ?

   .......................................................................................

3. සම්බන්ධයක් ඇත්නම්, එම සම්බන්ධතාවය මගින් භාණ්ඩයේ වටිනාකමට බලපෑමක් සිදු වී තිබේද ?

   .......................................................................................

4. විකුණුම විකුණුම්කරු විසින් පනවනු ලබන යම් කොන්දේසි හෝ සීමා කිරීම්වලට යටත් වන්නේ ද? (රේගු ආඥාපනතේ "ඉ" උපලේඛනයෙහි 1. (1)(අ),(ආ) ව්‍යවස්ථාව බලන්න)

   .......................................................................................

5. සර්වසම/සමාන ස්වරූපයේ භාණ්ඩවල පූර්ව ආනයන වේ නම් (මාස තුනක් ඇතුළත), රේගු ප්‍රකාශනයේ අංකය සහ දිනය :

   .......................................................................................

6. ගනුදෙනුවේ ස්වභාවය (විකුණුම්/ත්‍යාග/කුලී/යනාදිය) :

   .......................................................................................

7. රේගු සටහන්කරයේ (CUSDEC) අංකය : ලියාපදිංචි දිනය :

8. **ප්‍රකාශ කිරීම**

   1. මෙහි අඩංගු වන තොරතුරු රේගු සටහන්කරයේ සහ ඊට අමුණා ඇති ලේඛනවල දක්වා ඇති භාණ්ඩවල වටිනාකම් සම්බන්ධයෙන් බව මෙයින් ප්‍රකාශ කරමි.

   2. මෙහි අඩංගු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කරමි.

   3. **සාවද්‍ය ප්‍රකාශයක් කිරීම රේගු ආඥාපනතේ 52 වන වගන්තිය යටතේ දණ්ඩනයට/අභිමිකරණයට හෙවත් රාජ සන්තක කිරීමට ලක් වීමට හේතු වන බව මම දනිමි.**

   ආනයනකරුගේ/නියෝජිතයාගේ අත්සන : .........................  අත්සන් කළ අයගේ නම : .........................................................

   දිනය : ..........................................  සමාගමේ නම : ......................................................................

9. කාර්යාල භාවිතය සඳහා : සතුටුදායකයි/සැකසහිතයි/වංචාවක් සිදුව ඇති බවට අනුමාන කෙරේ.

........................................................................................................................................................................................................
........................................................................................................................................................................................................
........................................................................................................................

තක්සේරු නිලධාරියා : ........................................................................ දිනය : ..................................................

---

10. රේගු අධිකාරිවරයාගේ අදහස් : සතුටුදායකයි/සැකසහිතයි/වංචාවක් සිදුව ඇති බවට අනුමාන කෙරේ.

........................................................................................................................................................................................................
........................................................................................................................................................................................................
........................................................................................................................

රේගු අධිකාරි : ........................................................................ දිනය : ..................................................

**ශ්‍රී ලංකා රේගුව**

**අගය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය**

**රේගු සටහන්කරයේ අංකය :** ලියාපදිංචි දිනය :

| කාණ්ඩය | අයිතමය | විස්තරය | සන්නාමය/ නිෂ්පාදකයා | මාදිලිය | පිරිවිතරය | ප්‍රභවස්ථාන රට | ප්‍රමාණය | ඉන්වොයිසි වටිනාකම | එකතු කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

අත්සන සහ දිනය

07 - 474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.